**මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**

---

**01. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 01 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2014 නොවැම්බර් මාසයේදී සභාවට ලබාදී තිබුණු ගැල්වනයිස් බට 300 ක වටිනාකම වූ රු.324,143 ක් මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ දක්වා නොතිබුණි.

**02. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,683,183 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,719,342 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 හිඟ කඩකුලී**

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ලැබියයුතු එකතුව රු.273,876 ක්වූ හිඟ කඩකුලිය අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.2.2 මුද්දර ගාස්තු**

--------------

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු.4,944,557 ක්වූ හිඟ මුද්දර ගාස්තු ආදායමක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

**2.2.3 උසාවි දඩ**

------------

සභාව විසින් නඩත්තු කරනු ලබන ලේඛනවලට අනුව රු.590,968 ක්වූ හිඟ උසාවි දඩ ආදායම සමාලෝචිත වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4 වරිපනම් බදු**

--------------

2015 දෙසැම්බර් 31 දිනට රු.2,113,950 ක්වූ හිඟහිටි වරිපනම් බදු මුදල අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.2.5 දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු**

-------------------------------------

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට සභා බල ප්‍රදේශය තුල දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 34 ක් ස්ථාපිත කර තිබුණු අතර එම කුළුණු අයත් සමාගම් වලින් වාර්ෂික වෙළඳ බලපත්‍ර ගාස්තු සහ ව්‍යාපාර බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 හා 2014 වර්ෂවලට අදාලව සභාව වෙත ලැබියයුතු මුද්දර ගාස්තු ආදායමින් රු.789,104 ක් අනුරාධපුර මහ නගර සභාවට සහ රු.445,000 ක් නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව වෙත පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණු අතර, අදාල ලියාපදිංචි ලේඛනවල නිවැරදිතාවය තහවුරු කරගෙන එම මුද්දර ගාස්තු ආදායම නැවත සභාව වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ සේවය කිරීමෙන් අනතුරුව විශ්‍රාමගිය, වැඩ තහනම් කළ සහ ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 12 දෙනෙකුගෙන් අයවියයුතු එකතුව රු.189,180 ක්වූ ණය ශේෂ වසර 04 සිට වසර 10 ක කාලපරාසයක් තුල අයනොවී පවතින තත්ත්වය තුල එම මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඇ) 2007 වර්ෂයේ සිට සභාවට ලැබී තිබුණු රු.2,800,000 ක් වටිනා ට්‍රැක්ටර් සහ බවුසර් 07 ක් (203 වන අධිකාරය) මෝටර් වාහන පනත 2(i) වගන්තිය ප්‍රකාරව 2016 මැයි මස 30 දින වනවිටත් නියමිත ලියාපදිංචිය සිදුකර ගැනීමකින් තොරව ධාවනය කරමින් පැවැතුණි.

(ඇ) 2015 මැයි 13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව කටයුතු කරමින් සභා අරමුදලින් රු.300,000 ක් වැයකර සභාපතිවරයා සහ මන්ත්‍රීවරු විදේශ සංචාරවල යෙදී තිබුණි.

(ඉ) සභා බල ප්‍රදේශය තුල පිහිටි අක්කර 96 ක වපසරියකින් යුත් සුසාන භූමි 33 ක් සම්බන්ධයෙන් පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ 2006 නොවැම්බර් 14 දිනැති අංක පී.එල්/07/01/53 දරන පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ අංක 9 සඳහන් අංක 02 දරන යෝජනාවේ දක්වා ඇති නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඊ) සභාව විසින් ප්‍රමුඛතාගත මාර්ග නඩත්තු ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණු අතර, 2005 නොවැම්බර් 08 දිනැති අංක පී.එල්./07/01/53 දරන පලාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ අංක 06 හි 03 ඡේදයේ දැක්වෙන යෝජනා හා නිර්දේශ ක්‍රියාත්මක කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

## 3.2 ආර්ථික නොවූ ගනුදෙනු

-----------------------------

සභා බල ප්‍රදේශය තුල එකතු කරනු ලබන කසල බැහැර කිරීමට වලවල් සැකසීම සඳහා සමාලෝචිත වර්ෂය තුල රු.185,500 ක් වැයකර තිබුණද ඒවා ප්‍රයෝජනයට නොගෙන කොම්පෝස්ට් අංගනය පිහිටි ස්ථානය අසල ලඳු කැලෑවකට කසල බැහැර කර පුළුස්සන බව නිරීක්ෂණය විය.

## 3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

2014 වර්ෂයේදී ඉදිකිරීම් නිමකර ඇති කොම්පෝස්ට් අංගනයෙහි වටිනාකම සභාව හඳුනාගෙන නොමැති අතර එය ක්‍රියාකාරී මට්ටමින් පවත්වාගෙන යාමට කටයුතු නොකිරීම හේතුවෙන් දරන ලද වියදම වසරකට අධික කාලයක සිට නිශ්කාර්යව පැවතුණි.

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

(අ) දොරින් දොරට ගමින් ගමට ගම් 15000 ක් නගා සිටුවීමේ වැඩ සටහන යටතේ ඇත්දත්කල්ල පුබුදු පෙර පාසැල සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2015 සැප්තැම්බර් 08 දින රු.481,910 ක වටිනාකමකට ගිවිසුම් අත්සන් කර තිබුණු අතර මේ සඳහා සභාව විසින් රු.435,213 ක් කොන්ත්‍රාත්කරු වෙත 2015 දෙසැම්බර් 31 දින ගෙවා තිබුණු නමුත් එම ගොඩනැගිල්ල ඉදිකර තිබුණු භූමිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) හස්තිදන්ත විහාරස්ථානයේ පවත්වාගෙන යන පෙර පාසැලේ ඉඩ පහසුකම් අවම වීම නිසා නව ගොඩනැගිල්ලක් ඉදිකර පෙර පාසැල එහි පවත්වාගෙන යාමට තීරණය කර තිබුණු නමුත් 2016 අප්‍රේල් මාසය වනවිට ගබඩා කාමරය පමණක් ඉදිකර තිබුණු අතර ගොඩනැගිල්ල අවට භූමිය පහත් බිම් ප්‍රදේශයක් නිසා ජලයෙන් යටවන තත්ත්වය තුල ප්‍රයෝජනයට ගත නොහැකි මට්ටමක පවතින බැවින් මෙතෙක් දරා තිබෙන රු. 433,663 ක්වූ වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.

(ඈ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන නව වැඩ -2015 ව්‍යාපෘති යටතේ සභාව විසින් ක්‍රියාත්මක කළයුතු බවට අනුමත වූ රු.1,150,000 ක්වූ කර්මාන්ත 05 ක් සභාව විසින් ක්‍රියාත්මක නොකිරීම නිසා අවලංගු වී තිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

----------------------------

(අ) සභාව සතුව පවතින රු.1,575,000 ක්වූ වාහන තුනක් ධාවනය කළ නොහැකිව භාවිතයෙන් ඉවත්කර තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් වූ ඉදිරි ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේදී සභාවට ලබාදී තිබුණු රු.3,883,280 ක් වටිනාකමවූ යන්ත්‍රෝපකරණ වසරකට අධික කාලයක සිට නිශ්ක්‍රියව පවතින අතර ආදායම් උපයා ගැනීම සඳහා යොදාගෙන නොතිබුණි.

(ඇ) පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය මධ්‍යස්ථානයේ ප්‍රයෝජනය පිණිස 2015 වර්ෂයේදී ලබාදී තිබුණු රු.334,132 ක් වටිනා කසල වෙන්කිරීමේ යන්ත්‍රය ප්‍රයෝජනට නොගෙන නිශ්ක්‍රියව පැවතුණි.

**04 පද්ධති හා පාලනය**

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය